සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**


- මෙම ප්‍රශ්නපත්‍රය කොටස් දෙකකින් යුක්තය.
- **I** කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- **II** කොටස අනුකොටස් 03 කින් යුක්ත වේ. එක් අනු කොටසකින් එක ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.

---

- අංක 01 - 05 තෙක් වූ ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් **A, B, C, D, E** යන පින්තූර ඇසුරෙන් තෝරන්න.


**A**


**B**


**C**


**D**


**E**

(01) A අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
- (1) දැව පනේලයක් මත කැටයම් කර ඇත.
- (2) සාංචි ස්තූපයේ ගල් වැටේ කැටයමකි.
- (3) අමරාවතී ලක්ෂණ පෙන්නුම් කරයි.
- (4) සාංචි තොරණේ දැවමය කැටයමකි.
- (5) සාංචි තොරණ දැක්වෙන යක්ෂණී කැටයමකි. (........)

(02) B අක්ෂරයෙන් දැක්වෙන මුරගල හමුවනුයේ,
- (1) කුට්ටම් පොකුණ අසලිනි
- (2) පොළොන්නරුවේ රත්තප්‍රාසාදයෙනි.
- (3) අනුරපුර රත්නප්‍රාසාදයෙනි.
- (4) දළදා මාළිගාවෙනි.
- (5) බිසෝමාළිගාව ඉදිරිපිටිනි. (........)

(03) C අක්ෂරයෙන් දැක්වෙනුයේ,
- (1) සරල නිර්මාණයක කල්පිත මූර්තියකි.
- (2) අමූර්තවාදී මූර්ති ශිල්පී හෙන්රි මුවර්ගේ "මම" නම් වූ මූර්තියයි.
- (3) උද්‍යාන මූර්තියකි.
- (4) තිස්ස රණසිංහ ශිල්පියාගේ 'වැතිරගත් කත' නම් වූ මූර්තියයි.
- (5) හෙන්රි මුවර් ශිල්පියාගේ 'වැතිරගත් කත' නම් වූ මූර්තියයි. (........)

(04) D අක්ෂරයෙන් දැක්වෙනුයේ,
- (1) ශ්‍රී ලාංකික ලෝහ මූර්ති ශිල්පියෙකුගේ නිර්මාණයකි.
- (2) සුප්‍රසිද්ධ මූර්ති ශිල්පියෙකු වූ රිචඩ් ශ්‍රේබියල්ගේ නිර්මාණයකි.
- (3) "කවපෙත්ත විසි කරන්නා" නම් වූ මයිරන් ශිල්පියාගේ නිර්මාණයකි.
- (4) ග්‍රීක මූර්තියක් වූ මෙය ඇතීනා දෙවඟන වේ.
- (5) 'කවපෙත්ත විසි කරන්නා' නම් වූ මෙය ප්‍රැක්සිටෙලස්ගේ නිර්මාණයකි. (........)

(05) E අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවන මෙම මූර්තිය,

(1) ඉන්දියාවේ කුල්ලි සම්ප්‍රදාය හෙළි කරන ලෝහමය මූර්තියකි.

(2) ඉන්දියාවේ කුල්ලි සම්ප්‍රදාය හෙළිකරන හුණුගල් මූර්තියකි.

(3) ඉන්දු නිම්නයෙන් හමු වූ මැටි මූර්තියකි.

(4) ගුප්ත සම්ප්‍රදායට අයත් මූර්තියකි.

(5) ඉන්දියාවේ චෝල සම්ප්‍රදායට නෑකම් කියන්නකි. (........)

- **අංක 6 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(06) දිය සායම් මාධ්‍ය පිරිසිදුව භාවිත කිරීමෙන් ඇතිවන සුවිශේෂී ලක්ෂණයකි.

(1) වර්ණ විනිවිද පෙනෙන අයුරින් භාවිත කිරීම.

(2) පදාස වශයෙන් වර්ණ යෙදීම.

(3) සුදු වර්ණය මිශ්‍රණයෙන් භාවිතය.

(4) සංගත වර්ණ භාවිතය.

(5) දීප්තිමත් වර්ණ යොදමින් රූප මතු කිරීම. (........)

(07) භාණ්ඩයක් සැලසුම් කිරීමේදී අපි වඩාත් සැලකිලිමත් විය යුතු වන්නේ,

(1) පහසුවෙන් නිර්මාණය කළ හැකි වීම. (2) සිත්ගන්නා සුළු නිමාව

(3) නිර්මාණයට හා පරිහරණයට පහසු වීම. (4) මිළ අඩුවෙන් අලෙවි කිරීම.

(5) වර්ණමාලාව දීප්තිමත් වීම. (........)

(08) හිඳගල ලෙන් විහාර සිතුවම් 7 වන සියවසට අයත්ය. අද මේවා ශේෂ වී පවතී. මේ සිතුවම් තුළින් ප්‍රකාශ වනුයේ,

(1) සක්දෙවියන් පිරිනමන දානය පිළිගැනීමට සැරසීමයි.

(2) ඉන්ද්‍රසාල ගුහාවේ බුදුන් වහන්සේ විවේක සුවයෙන් සිටින බවයි.

(3) තුසිත දෙව්ලොවට වැඩි බුදුන්වහන්සේ මාතෘ දිව්‍යරාජයාට විජම්බණ දෙසණ අවස්ථාවකි.

(4) තපස්සු භල්ලුක බුදුන්වහන්සේගේ කේශධාතු පිළිගන්නා බවයි.

(5) (........)

(09) මහියංගන ධාතු ගර්භයේ චිත්‍ර,

(1) පොළොන්නරු සමයේ මුල් භාගයට අයත් වේ.

(2) පොළොන්නරු සමයේ අවසාන භාගයට අයත් වේ.

(3) පොළොන්නරු හා අනුරපුර යුග දෙකටම අදාළ ය.

(4) අනුරපුර මුල් කාලයට අයත් ය.

(5) පොළොන්නරු යුගයෙන් පසුව නිම කරන්නට ඇත. (........)

(10) යුරෝපයේ හේගියා සොපියා දේවස්ථානය ඉදිකර ඇත්තේ,

(1) බයිසන්තියානු ගෘහ නිර්මාණ ශිල්පක්‍රම අනුවය.

(2) ගොතික් ගෘහ නිර්මාණ ශිල්පක්‍රම අනුවය.

(3) ග්‍රීක වාස්තු විද්‍යා ශිල්පක්‍රමය අනුවය.


(4) මිසර ගෘහ නිර්මාණ අනුවය.

(5) රෝම ගෘහ නිර්මාණ අනුවය. (........)


The National e-Learning Portal for the General Education


- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් F, G, H, I, J යන පින්තූර ඇසුරෙන් තෝරන්න.**


**F**


**G**


**H**


**I**


**J**

(11) F අක්ෂරයෙන් දැක්වෙන සියුම් නිමාවකින් යුතු නිර්මාණය,
- (1) අනුරපුර යුගයේ චිත්‍ර කැටයම් ශිල්පීන්ගේ කුසලතාවයයි.
- (2) ගම්පොල යුගයේ චිත්‍ර කැටයම් ශිල්පීන්ගේ කුසලතාවයයි.
- (3) මහනුවර යුගයේ චිත්‍ර කැටයම් ශිල්පීන්ගේ කුසලතාවයයි.
- (4) දඹදෙණි යුගයේ චිත්‍ර කැටයම් ශිල්පීන්ගේ කුසලතාවයයි.
- (5) පොළොන්නරු යුගයේ චිත්‍ර කැටයම් ශිල්පීන්ගේ කුසලතාවයයි. (........)

(12) B අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහණ,
- (1) පොළොන්නරු පොත්ගුල් විහාර භූමියේ ඇත.
- (2) අනුරපුර බිසෝ මාලිගය ඉදිරිපිට ඇත.
- (3) අනුරපුර කැටයම් ශිල්පියාගේ කුසලතාවයයි.
- (4) අනුරපුර රත්නමහල් ප්‍රාසාදය ඉදිරිපිට ඇත.
- (5) පොළොන්නරු ශිල්පියාගේ කුසලතාවයයි. (........)

(13) G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
- (1) ශ්‍රී ලාංකික මූර්ති ශිල්පියකුගේ නිර්මාණයකි.
- (2) 'රිචඩ් ගේබ්‍රියල්' නම් සුප්‍රසිද්ධ ශිල්පියාගේ මූර්තියකි.
- (3) ලංකාවේ මූර්ති ශිල්පි තිස්ස රණසිංහගේ මූර්තියකි.
- (4) දුෂ්කර ක්‍රියාව නිරූපිත ටෙරාකොටා මූර්තියකි.
- (5) මූර්ති ශිල්පී ආරියවංශ වීරක්කොඩිගේ නිර්මාණයකි. (........)

(14) I අක්ෂරයෙන් දැක්වෙන්නේ,
- (1) තන්ජෝදරයේ රාජ රාජේෂ්වර දෙවොලයි.
- (2) මහා බලිපුරම් 'භීරාත්' දෙවොලයි.
- (3) මහා බලිපුරම් 'මහීෂමාධිනී' දෙවොලයි.
- (4) මහා බලිපුරම් 'වැල්ලේ' දෙවොලයි.
- (5) තන්ජෝදරයේ 'භීරාත්' දොවොලයි. (........)

(15) J අක්ෂරයෙන් දැක්වෙන්නේ,
- (1) ඇතැන්ස් වල පාතිනන් දෙවොලයි.
- (2) ඔලිම්පියාවල 'හේරා' දෙවොලයි.
- (3) ඇතැන්ස් වල ඔලිම්පියන් සියුස් දෙවොලයි.
- (4) ඇත්න්ස් වල පාර්තිනොන් දෙවොලයි.
- (5) ඇතැන්ස්වල සියුස් දෙවොලයි. (........)

The National e-learning Portal for The General Education

- **අංක 16 සිට 20 තෙක් ඇති එක් එක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(16) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් ඇඳීමේදී මානව හා සත්ත්ව රූප,

(1) සංකේතාත්මකව ප්‍රාථමික ලක්ෂණ මතු කර ඇත.
(2) ජීව ප්‍රමාණයට වඩා විශාලව ඇන්දාහ.
(3) ක්‍රියාකාරීව ස්වභාවික ලක්ෂණ මතුකොට ඇඳ ඇත.
(4) සන්නිවේදන ක්‍රියාවලියකට උචිත පරිදි යොදාගෙන ඇත.
(5) දඩයම් ජීවිතය සාර්ථකව ඇඳ පෙන්වූහ. (........)

(17) රාජ්පුට් සිතුවම් ශිල්පියාගේ සිතුවම් සඳහා බහුල වශයෙන් පාදක වූයේ,

(1) රාජකීයයන්ගේ දඩයම් සිද්ධිය. (2) රජුන්ගේ වීර කතාය.
(3) පූජකවරුන්ගේ ආගමික සිද්ධීන්ය. (4) හින්දු සංස්කෘතියේ දේව කතාය.
(5) ඓතිහාසික සිද්ධි හා සම්බන්ධ පුවත් ය. (........)

(18) මධ්‍ය කාලීන සිංහල කලා ශිල්ප නමැති ග්‍රන්ථයෙන් කලාවේ අරුමය ලොවට දායාද කළ පුරාවිද්‍යාඥයා වූයේ,

(1) සෙනරත් පරණවිතාන ශූරීන්ය. (2) එච්. සී. පී. බෙල් මහත්මාය.
(3) ආනන්ද ගුරුගේ මහත්මාය. (4) චාල්ස් ගොඩකුඹුර මහත්මාය.
(5) ආනන්ද කුමාරස්වාමි මහත්මාය. (........)


(19) ද්‍රව්‍ය බලා ඇඳීම අධ්‍යයනය කිරීමෙන් අපේක්ෂා කරනුයේ,

(1) නිදහස් රේඛා ඇසුරෙන් ද්‍රව්‍යයන්ගේ ස්වභාවය ප්‍රකාශ කිරීමයි.
(2) රේඛාකරණය පිළිබඳව නිපුණත්වයක් ලැබීමයි.
(3) මූලික සිද්ධාන්ත පිළිබඳව අවබෝධයක් ලැබීමයි.
(4) වර්ණ භාවිතයේ කුසලතා ලබාගැනීමයි.
(5) වස්තූන්ගේ ස්වභාවයන් නිර්මාණාත්මකව ඇඳීමට හුරුවීමයි. (........)


(20) ගඩලාදෙනි විහාරයේ බාහිර පෙනුම අනෙක් බෞද්ධ විහාරස්ථානවලට වඩා ස්වරූපයෙන් වෙනස් වන්නේ,

(1) කළුගලින් මුළු ගොඩනැගිල්ලම නිම කර ඇති නිසාය.
(2) හින්දු ආගමික දේවස්ථාන ස්වරූපය ගන්නා නිසය.
(3) දකුණු ඉන්දීය ගෘහනිර්මාණ ශිල්පියකුගේ නිර්මාණයක් නිසාය.
(4) හින්දු ආගමික සංකල්ප බලපා ඇති නිසාය.
(5) විහාරය මත අෂ්ටාස්‍ර පිහිටා ඇති නිසාය. (........)


- **අංක 21 සිට 25 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් K, L, M, N, O යන රූප සටහන් ඇසුරින් තෝරන්න.**


K


L


M


N


O

(21) K අක්ෂරයෙන් දැක්වෙන්නේ අධිරාජයාගේ විජයග්‍රහණ තොරතුරුය. මෙම තොරතුරු ඇති ස්ථම්භය වන්නේ,

(1) ට්‍රජන් ස්ථම්භයයි. (2) මාකස් ස්ථම්භයයි. (3) කොන්තීනස් ස්ථම්භයයි.
(4) රුම්මින්දෙයි ස්ථම්භයයි. (5) ඔගස්ටස් ස්ථම්භය (........)

(22) L අක්ෂරයෙන් දැක්වෙන්නේ නළඟන රුව කැටයමයි. මෙය දක්නට ලැබෙනුයේ,

(1) ඇම්බැක්කේ දේවාලයේ ලී කුළුණු කැටයම්වලය.
(2) පනාපිටිය අම්බලමේ පාදමේ ජනේල කැටයම්වලය.
(3) මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේය.
(4) පොළොන්නරු අටදාගෙයි පාදමේ බොරදම් තීරු මතය.
(5) යාපහුව කැටයම් වලය. (........)

(23) M අක්ෂරයෙන් දැක්වෙන බලකොටුව තම රජධානිය ලෙස තෝරාගත්තේ,

(1) පාණ්ඩුවාසදේව රජු (2) 4 වන විජයබාහු රජු (3) විජයබාහු රජු
(4) 1 වන බුවනෙකබාහු රජු (5) වළගම්බා රජු (........)

(24) N අක්ෂරයෙන් දක්වෙන්නේ,


(1) බිත්ති කැටයමකි. (2) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයෙන් හමුවූ මුද්‍රවකි.
(3) සාංචි කැටයමකි. (4) භාරුත් ගල්වැටේ කැටයමකි.
(5) එල්ලෝරා කැටයමකි. (........)

(25) O අක්ෂරයෙන් දැක්වෙන්නේ 'විජයොත්පායයි'. මෙය,

(1) ගම්පල යුගයට අයත් එකකි. (2) මහනුවර යුගයට අයත් එකකි.
(3) අනුරපුර යුගයට අයත් එකකි. (4) පොළොන්නරු යුගයට අයත් එකකි.
(5) දඹදෙණිය යුගයට අයත් එකකි. (........)


- **අංක 26 සිට 30 තෙක් වූ ප්‍රශ්න ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඇසුරින් විමසන්න.**

(26) මෙහි දැක්වෙනුයේ,




(1) රෝමවරුන්ගේ නිමවුමකි.
(2) ග්‍රීකයින්ගේ නිමවුමකි.
(3) මිසරයින්ගේ නිමවුමකි.
(4) පාතිතන් දොවොලේ කුළුණු විශේෂයකි.
(5) පර්සියන්වරුන්ගේ නිමවුමකි. (........)

(27) මෙහි දැක්වෙන්නේ,




(1) ටැම්පිට විහාරයයි.
(2) මැදවෙල විහාරයයි.
(3) පනාපිටිය අම්බලමයි.
(4) දන්තුරේ විහාරයයි.
(5) ටැම්පිට ඉදිකළ ධර්ම ශාලාවයි. (........)

(28) භාරතයෙන් හමුවන සුවිශේෂී නිමවුමකි.




(1) අජන්තා ලෙන් දොරටුවකි.
(2) එල්ලෝරාවේ දොවොලකි.
(3) අජන්තා ලෙන් විහාරයක ඇතුලතකි.
(4) එල්ලෝරාවේ කෛලාසනාථ දෙවොලයි.
(5) එල්ලෝරා ජෛනගුහා පිවිසුමයි. (........)

(29) මෙම වාස්තු විද්‍යා නිර්මාණය,



(1) අනුරපුර ථූපාරාම වටදාගෙයයි.
(2) මිහින්තලේ අම්බස්තල වටදාගෙයයි.
(3) මැදිරිගිරිය වටදාගෙයයි.
(4) තිරියායේ වටදාගෙයයි.
(5) පොළොන්නරුවේ වටදාගෙයයි. (........)

(30) මෙහි දැක්වෙන හින්දු ආගමික වාස්තුවිද්‍යාත්මක ගොඩනැගිල්ල,



(1) පල්ලව ගොඩනැගිල්ලකි.
(2) පොළොන්නරු හින්දු කෝවිල් ගොඩනැගිල්ලකි.
(3) එල්ලෝරාවේ දෙවොල් ගොඩනැගිල්ලකි.
(4) මහාබලිපුරම් වල රථදෙවොලයි.
(5) මහාබලිපුරම්හි වෙරළේ දෙවොලයි. (........)

- **අංක 31 - 35 තෙක් වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

(31) කැලණි විහාර සිතුවම්වල 'දළදා වැඩමවීම' සිතුවමේ ශිල්පීන්ගේ පරමාර්ථය වූයේ,
(1) මානව රූප සංයමයෙන් යුතුව ප්‍රකාශ කිරීම.
(2) පූජනීයත්වය හා ගාම්භීරත්වය දැක්වීම.
(3) තාත්විකත්වයට ගැඹුරු හැඩතල හා සංගත වර්ණමාලාව
(4) ත්‍රිමාණ හැඩතල හා සංගත වර්ණවලින් යථාරූපි ස්වභාවය.
(5) වර්ණ සංයෝජනය හා ප්‍රභේදකරණය. (........)

(32) ඉසුරුමුනියේ ඇත් රූප පිහිටි ගලේ නිර්මාණය කර ඇත. ඉන් ප්‍රකාශ වනුයේ,
(1) ඇත් රූප නෙලීමේ ශිල්පීය හැකියාව ප්‍රකාශ කිරීමයි.
(2) පර්ජන්‍ය පහලවීම සංකේතවත් වීමයි.
(3) ඇතුන්ගේ ජල ක්‍රීඩා තුළින් සෞභාග්‍ය සංකේතවත් වීමයි.
(4) පල්ලව කලා සම්ප්‍රදාය තුළ ඇතාට ඇති ගෞරවයයි.
(5) රන්මසු උයනේ ඇත් රූප ප්‍රතිනිර්මාණය වීමයි. (........)

(33) මෝගල් කලාව උතුරු ඉන්දියාවේ වර්ධනය විය. මෙම කලාව
(1) රජු ඇතුලු පාලකයින්ගේ අනුග්‍රහය ඇතිව වර්ධනය විය.
(2) ජන ජීවිතයේ සිද්ධීන්ට මුල්තැන දුන් ස්වභාවික කලාවකි.
(3) ආගමික තේමාවන් පදනම් කරගෙන ව්‍යාප්ත වූ කලාවකි.
(4) පර්ෂියානුවන් ඉන්දියාවට හඳුන්වාදුන් කලාවකි.
(5) සිද්ධාන්ත භාවිතා නොකළ ශෛලගත කලා සම්ප්‍රදායකි. (........)

(34) කලා කෘතියක් ඇගයීමේදී වඩාත් වැදගත් වනුයේ,

(1) තේමාවේ ඇති හරවත් බවයි.

(2) මාධ්‍ය හැසිරවීමේදී ශිල්පියා දක්වා ඇති කුසලතාවයයි.

(3) සිද්ධාන්ත භාවිතයේ ඇති යෝග්‍යතාවයයි.

(4) මාධ්‍ය තුළින් තේමාව ප්‍රකාශ කර ඇති ආකාරය හා එහි අපූර්වත්වයයි.

(5) ඉහත කරුණු සියල්ලම වැදගත් වේ. (........)

(35) මහේශාක්‍ය පෙනුම ඇති සුවිසල් වාස්තු විද්‍යා නිර්මාණ බිහිවීමේලා රෝමවරුන්ට හැකි වූයේ,

(1) අධිරාජ්‍යවරුන්ගේ සුබෝපභෝගී ජීවිතයට අවශ්‍ය විවිධ මාදිලියේ ගොඩනැගිලි සඳහා අනුග්‍රහය ලැබීම.

(2) විවිධ වර්ගයේ කිරිගරුඬ හා වෙනත් අමුද්‍රව්‍ය රෝමය තුළ බහුල වීම.

(3) පැරණි ග්‍රීක වාස්තු විද්‍යා ශිල්ප ක්‍රමය අනුකරණය කළහ.

(4) ඇරුක්කුව හා බොකු වහල ක්‍රමය භාවිතයට ගැනීම නිසා

(5) මිසරවරුන්ගේ මූලික අඩිතාලම මොවුන් අනුකරණය කිරීම. (........)

- **අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.**



(36) මෙම සිතුවම දක්නට ලැබෙනුයේ,

(1) මුල්කිරිගල විහාරයේය.

(2) කරගම්පිටිය විහාරයේය.

(3) කතලුව රජමහ විහාරයේය.

(4) දඹුල්ල රජමහ විහාරයේය.

(5) දෙගල්දොරුව රජමහ විහාරයේය. (........)

(37) මෙම සිතුවමින් නිරූපණය වන්නේ,

(1) සිදුහත් කුමරුගේ විවාහ මංගල්‍යයි.

(2) සිදුහත් කුමරු ගිහිගෙයි අතහැර යාමයි.

(3) සිදුහත්කුමරු සතරපෙරනිමිති දැකීමයි.

(4) සිදුහත්කුමරු ශිල්ප හැදෑරීමයි.

(5) සිදුහත් කුමරුගේ රාජ්‍යත්වයට පත්වීමේ උත්සවයයි. (........)

(38) මෙම සිතුවම මහනුර යුගයේ,

(1) උඩරට සම්ප්‍රදායට අයත් ය. (2) පහතරට සම්ප්‍රදායට අයත් ය.

(3) සබරගමු සම්ප්‍රදායට අයත් ය. (4) අජන්තා කලාවට අයත් ය.

(5) මෝගල් කලා සම්ප්‍රදායට අයත් ය. (........)

(39) මෙම සිතුවමින් දක්වනුයේ,

(1) ජාතක කතාවකි. (2) දඹුළු ලෙන් සිතුවමකි. (3) ලී කැටයමකි.

(4) බුද්ධ චරිතයේ සිදුවීමකි. (5) අජන්තා ලෙන් සිතුවමකි. (........)

(40) මෙම සිතුවම අයත් යුගය වන්නේ,

(1) අනුරාධපුර යුගයටය. (2) ගම්පල යුගයටය. (3) දඹදෙණි යුගයටය.

(4) පොළොන්නරු යුගයටය. (5) මහනුවර යුගයටය. (........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - I

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

## II කොටස

### "අ" කොටස

01. කාශ්‍යප රජ දවස සීගිරියේ බිහි වූ කලාව ශ්‍රී ලාංකිකයන් සතු අභිමානවත් නිර්මාණ හැකියාව ලොවටකියා පෑමට සමත්ය.

(i) සීගිරි චිත්‍රවල ශිල්පක්‍රමය පිළිබඳව පරණවිතාන ශූරීන් ප්‍රකාශ කළ මතය කුමක්ද?

(ii) එම මතය ප්‍රකාශ කිරීමට එතුමා හට හේතු පාදක වූ කරුණු සැකවින් පහදන්න.

(iii) තිඹිරිවැව සෙල්ලිපියේ සඳහන් පරිදි "කසබල අලක පය මහරජ" යන්න සීගිරි නිර්මාණ තුළින් කෙතෙක්දුරට අර්ථවත් වේද?

02. පාරම්පරික සැරසිලි මෝස්තර නිර්මාණය කිරීමේදී ශ්‍රී ලාංකික චිත්‍ර ශිල්පියා බෙහෙවින් උපයෝගී කොට ගෙන ඇත්තේ ස්වභාවික පරිසරයේ හමුවන ශාක හා සත්ව ජීවිතයි.

(i) ස්වභාවික මල් යොදාගනිමින් නිර්මාණය කළ මෝස්තර ඒකක පහක් නම්කර ඇඳ දක්වන්න.

(ii) ස්වභාවික වස්තුවක් නිර්මිත මෝස්තරයක් බවට පත් කිරීමේ දී ශිල්පියා සතු නිර්මාණශීලී හැකියාව උපයෝගී කොටගෙන ඇති අයුරු ඒකක තුනක් ඇසුරින් පහදන්න.

### "ආ" කොටස

03. භාරතයේ හයිද්‍රබාද් ප්‍රදේශයේ වඝෝරා ගංගාව අසබඩ පිහිටි මහා ගල් පර්වතයක කණින ලද ලෙන් 29 කින් සමන්විත අජන්තාව බෞද්ධ මධ්‍යස්ථානයක් සේම කලාගාරයකි.

(i) මෙහි චෛත්‍ය ශාලා හා විහාර ශාලා යනුවෙන් දෙවර්ගයකි. මේවායේ දළ සැලැස්ම ඇඳ දක්වන්න.

(ii) අජන්තාවේ හමුවන බෞද්ධ සිද්ධි දෙකක් නම් කර ඒවායේ ප්‍රකාශිත පුවත සැකවින් හඳුන්වන්න.

(iii) අජන්තාවේ 17 වන ගුහාවේ හමුවන "සිංහලාවදානය" ඓතිහාසික සිද්ධියක් නිරූපණය කෙරෙන සිතුවමකි. මෙහි නිරූපිත අවස්ථා හඳුන්වමින් සම්පිණ්ඩනය පිළිබඳ ඇගයීමක් කරන්න.

04. භාරුත, සාංචි හා අමරාවතී ස්තූප ආශ්‍රිත ගල්වැටවල සමාන ලක්ෂණ දැකිය හැකි නමුදු කැටයම් යෙදීම සම්බන්ධයෙන් විෂමතා ඇත.

(i) භාරුත් ගල් වැටේ දක්නට ඇති ප්‍රධාන අංග 03 නම් කරන්න.

(ii) අමරාවතී ස්තූපයේ ස්භාවය දැක්වෙන කැටයම් පුවරුවක් එහි නටඹුන් අතුරෙන් හමු වී ඇත. ඒ අනුව එම ස්තූපයේ වාස්තු විද්‍යා ලක්ෂණ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

(iii) භාරුත් ස්තූපයේ වෘත්තාකාර පනේලයක එන "මහා කපි ජාතකය" දැක්වෙන කැටයමත්, අමරාවතී ගල් වැටෙන් හමුවන "නාලගිරි දමනය" කැටයමත් අතර දැකිය හැකි සමාන අසමානතා සංසන්දනාත්මකව විමසන්න.

**"ඉ" කොටස**

05. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගුහාචිත්‍ර ඇසුරෙන් ඒ යුගයේ විසූ මානවයා සතු සෞන්දර්යය අවබෝධය මෙන් ම සමාජ තොරතුරු රැසක් අණාවරණය කර ගැනීමට හැකිවී ඇත.

(i) ප්‍රංශයේ හා ස්පාඤ්ඤයේ චිත්‍ර දක්නට ඇති ගුහා 02 බැගින් හඳුන්වා ඒ එකිනෙකට සුවිශේෂී වූ චිත්‍රය බැගින් නම් කරන්න.

(ii) එම චිත්‍රය ඇඳීමට ගුහා සිත්තරුන් පෙළඹුණේ ඇයි දැයි විද්වතුන් පලකළ මත ඇසුරෙන් විමසීමක් කරන්න.

06. ක්‍රි.පූ 3000 දී පමණ ඇරඹි මිසර කලාව ඔවුන්ගේ අභිරහස් ජීවන තොරතුරු ගොළුබසින් කියාපායි.

(i) මිසර සම්ප්‍රදායික ලක්ෂණ නිරූපණය වන මූර්ති දෙකක් නම් කරන්න.

(ii) මිසර සම්ප්‍රදායික චිත්‍ර ශෛලිය තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ හතරක් ලියන්න.

(ii) සම්ප්‍රදායික කලා නිර්මාණ තුළ හිරවී සිටි මිසර මූර්ති ශිල්පීන් පසුව ඉන් මිදී ස්වභාවික මූර්ති නිර්මාණයට පෙළඹුන බව පෙනේ. උදාහරණ දෙකක්වත් ගෙන විමසන්න.

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - II

**13 ශ්‍රේණිය**

උපදෙස්

- ඔබේ විභාග අංකය, ඔබ චිත්‍රය අඳින කඩදාදියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙක ඇලීම ඔබට අවාසි විය හැක.

---

- ස්වභාවිකත්වය අධ්‍යයනය හා
- නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.

- පහත කරුණු අවධානයට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැළෑටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.

01. කඩදාසි තලය, අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

02. ද්‍රව්‍යවල හා පැළෑටියේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ සැලකිලිමත් වන්න.

03. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

04. වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.

05. ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.

06. ද්‍රව්‍ය සමූහයට තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කර ගැනීමට පුළුවන.

07. දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කළ හැකිය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# චිත්‍ර කලාව - III

**13 ශ්‍රේණිය**

- මෙම පත්‍රය කොටස් තුනකින් යුක්තය. කොටස් තුනෙන් එක් කොටසක් තෝරාගන්න. එම කොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

---

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

- **පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගන්න.**

01. සංචාරකයින් සිත් ගත් මිහින්තලා පුද බිම.

02. තොටුපලක දිය නාන ගැමිලියෝ

03. අස්වනු නෙලන ගොවියෝ

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

04. සත්ත්ව හැඩතල ඇසුරින් බිත්ති සැරසිල්ලක්

05. සිංහල සැරසිලි මෝස්තර ඇසුරින් බන්දේසියකට සුදුසු නිර්මාණයක්

06. පිඟන් ගඩොලක් සඳහා යෙදිය හැකි මුළුතල මෝස්තරයක් අඳිමු

## 'ඉ' කොටස - ග්‍රැෆික්

07. නාට්‍ය පොතක පිටකවරයට සුදුසු නමක් හා ගැළපෙන නිර්මාණයක් කරන්න.

08. ක්‍රීඩා උත්සවයකට සුදුසු ආරාධනා පත්‍රයක් සකසන්න.

The National e-learning Portal for The General Education